සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

11 ශ්‍රේණිය **ඉස්ලාම් ධර්මය** කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01 මුහම්මද් නබි (සල්) තුමා ''අවසාන නබි'' යන්න සඳහන් අල්කුර්ආන් වාක්‍යය.

(1) කාෆ්ෆතුන් ලින්නාස් (2) කාතමුන් නබීයියින්

(3) රහ්මතන් ලිල් ආලමීන් (4) සෙයියදුල් මුර්සලීන්

02 නිධන් වස්තු වශයෙන් ලැබූ රන් කාසි සඳහා වූ zසකාත් ප්‍රමාණය,

(1) 2½ % (2) 5% (3) 10% (4) 20%

03 ඉස්ලාමීය කිලාෆතයේ ''අමීර්'' යනුවෙන් හඳුන්වන්නේ,

(1) හමුදා නිලධාරියා (2) පරිපාලන නිලධාරියා

(3) විනිශ්චයකාරවරයා (4) ලේකම්වරයා

04 ගැබිණියකව සිටියදී ස්වාමියා අහිමි වූ කාන්තාව ඉද්දා සිටිය යුතු කාල සීමාව

(1) මාස 4 කි (2) මාස 4 යි. දින 10 කි.

(3) දරු ප්‍රසූතිය දක්වාය. (4) මාස 3 කි.

05 හිල්ෆුල් ෆුලුල් නැමති සමාජ සේවා ආයතනය පිහිටුවන ලද්දේ,

(1) අබ්බාසිය පාලන සමයේ (2) උමෙයියා පාලන සමයේ

(3) උස්මානියා පාලන සමයේ (4) ජාහිලියියා කාලයේ

06 භාර්යාව තම ස්වාමිපුරුෂයාගෙන් ඉල්ලීම් කිරීමෙන් දික්කසාද වීමේ ක්‍රමය,

(1) තලාක් (2) කුල්උ (3) ෆස්කු (4) මුත්ආ

07 ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනගහනය වැඩියෙන් ඇති පළාත,

(1) බස්නාහිර පළාත (2) උතුරු පළාත

(3) දකුණු පළාත (4) නැගෙනහිර පළාත

08 සලාතය සඳහා වූ අzසාන් ප්‍රථමයෙන් පැවසූ ස්ථානය,

(1) මක්කා (2) මදීනා (3) කුබා (4) අරෆා

09 ''මිනිසා දැනුම සොයා යාම මිස මිනිසා සොයා දැනුම නොයයි'' යනුවෙන් ප්‍රකාශ කළේ,

(1) ඉමාම් අබු හනීෆා (2) ඉමාම් ෂාෆීඊ

(3) ඉමාම් බුහාරි (4) ඉමාම් මාලික්

10 සත්ව මනෝ විද්‍යාව පිළිබඳ අල් ජාහිස් විසින් රචිත ග්‍රන්ථය,

(1) කිතාබුල් හයිවාන් (2) අල් හාවි

(3) අල් කානුන් (4) කිතාබ් අල් ජුතරි

11 හදීස් දැනුම් දෙන්නන්ගේ ඉතිහාසය පහදන කලාව,

(1) අල් ඉස්නාද් (2) අස්මාඋර් රිජාලා

(3) ඉල්මුල් ජරහ් වත්තඃදිල් (4) උසුලුල් හදීස්

12 ව්‍යාපාරයට මූලික නොවන්නේ,

(1) තැරැව්කරු (2) ගැණුම්කරු (3) විකුණුම්කරු (4) විකුණුම් ද්‍රව්‍ය

13 අයෙකුගේ මරණයෙන් පසු දේපල වෙනත් අයෙකුට පැවරීම,

(1) වසීයියත් (2) වරාසත් (3) වක්ෆ් (4) හිබත්

14 කලීෆා මුඃතසීම් ඉමාම් හන්බලි (රහ්) තුමාට නියම කළ දඬුවම,

(1) මරණීය දඬුවම (2) දෑත් සිඳලීම

(3) පිටුවහල් කිරීම (4) කස පහර 1000

15 පොලී රහිත ණය ක්‍රමය හඳුන්වන පදය,

(1) ඉජාරා (2) කර්ල් (3) වකාලා (4) රහ්න්

16 හජ් හි සඊ ඉටු කිරීම හා සම්බන්ධ ස්ථානය,

(1) කඃබා (2) මිනා (3) සෆා මර්වා (4) මුස්දලිෆා

17 මසාඉල් සාලිහ් ග්‍රන්ථය සම්බන්ධ කලාව

(1) හදීස් (2) ෆික්හ් (3) තෆ්සීර් (4) සීරා

18 ඉස්ලාමයේ පළමු කුත්බා දේශනය පැවැත්වූ ස්ථානය,

(1) වාදි සාලීම් (2) දාරුල් අර්කම් (3) දාරුල් ඉන්ෂා (4) තුල්මජාස්

19 කලීෆා හාරූන් අල් රෂීද් විසින් ලංකාවට එවනු ලැබූ විද්වතා,

(1) ඉබ්නු බතූතා (2) ඔරාබි පාෂා

(3) ඉබ්නු අරබි (4) කාලිද් ඉබ්නු බකායා

20 දීර්ඝ කාලයක් අවංකව පාලනය කළ කලීෆාවරයා,

(1) අබු බක්කර් (රලි) (2) උමර් (රලි)

(3) උස්මාන් (රලි) (4) අලි (රලි)

21 වෛද්‍ය විද්‍යාවේ පියා වශයෙන් සැලකෙන විද්වතා,

(1) ඉමාම් ගස්සාලි (2) ඉබ්නු සීනා

(3) අල් ක්වාරිස්මි (4) සකරියියා අර් රාසි

22 රන් සඳහා වූ නිසාබ් ප්‍රමාණය මිස්කාල් ගණනින්,

(1) 85 කි. (2) 30 කි. (3) 20 කි. (4) 75 කි.

23 මුහම්මද් බින් කාසිම් සෙන්පතියා අත්පත් කරගත් රාජ්‍යය,

(1) ඉන්දියාව (2) ඉරාකය (3) ඉරානය (4) ඊජිප්තුව

24 ආෂුරා සහ තාසුආ දින ඇතුළත් මාසය,

(1) රාමළාන් (2) මුහර්රම් (3) සෆර් (4) ෂව්වාල්

25 කුර්ආනය මවන ලද්දක් නිසා එය විනාශ විය හැකියැයි තර්ක කළ අකීදාවට විරුද්ධ පිරිස

(1) කද්රියා (2) ෂිආ (3) මුඃතසිලා (4) කවාරිජ්

The National e-Learning Portal for The General Education

26 අල් මුජ්තනා නමින් ආමන්ත්‍රණය වන අස්සිහාහුස්සිත්තා ග්‍රන්ථය වන්නේ,

(1) සහීහුල් බුහාරි (2) ජාමිඋත් තිර්මිදි (3) සහීහ් මුස්ලිම් (4) සුනත් නසාඊ

27 උමෙයා වරුන්ගේ පාලනය අවසන් වූ වසර,

(1) හිජ්රි 40 (2) හිජ්රි 132 (3) හිජ්රි 656 (4) හිජ්රි 320

28 අධික ලෙස දන් දීම නිසා දිගු අතැත්තිය යනුවෙන විරුදාවලිය ලත් උම්මහාතුල් මුඃමිනීන්වරිය,

(1) සෙනබ් බින්ත් ජහ්ෂ් (රලි) (2) උම්මු සල්මා (රලි)

(3) හෆ්සා (රලි) (4) අයිෂා (රලි)

29 දේපල උරුමය ලැබිය යුතු මුල්ම කාණ්ඩය,

(1) අස්හාබුල් ෆුරූල් (2) අල් අසබා (3) අල් අර්හාම් (4) අල් වසීයියු

30 උස්මාන් (රලි) තුමාගේ වෆාතයට හේතු වූයේ ,

(1) අබු ලූඃලු (2) ඉබ්නු මුල්ජිම්

(3) අබු කුආෆා (4) අබ්දුල්ලාහ් ඉබ්නු සබා

31 දිවානුල් බරීද් යනු,

(1) ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව (2) තැපැල් දෙපාර්තමේන්තුව

(3) හමුදා දෙපාර්තමේන්තුව (4) ගමනාගමන දෙපාර්තමේන්තුව

32 එදිනෙදා ක්‍රියාවන් පිළිබඳ ස්වයං විමසුම

(1) මුසාබහා (2) මුආනකා (3) මුලාරබා (4) මුහාසබා

33 කෙනෙකුගේ බිරිඳකගේ සහෝදරිය කාලයකදී ඔහුට ,

(1) ස්ථිර මහ්රම් (2) අජ්නබි

(3) තාවකාලික මහ්රම් (4) මහ්රම්

34 මුස්ලිම්වරුන්ගේ පළමු කිබ්ලාව වනුයේ,

(1) මස්ජිදුල් අක්සා (2) මස්ජිදුන් හරම්

(3) මස්ජිදුල් නබවි (4) මස්ජිදුන් කුබා

35 zසකාතය ගණනය කරන කටයුතු වල නියලෙන්නා,

(1) ෆකීර් (2) ආමිල් (3) රිකාබ් (4) කාරිමූන්

36 කරාමත් හිමි කාණ්ඩය වනුයේ,

(1) නබිවරු (2) රසූල්වරු (3) සහාබාවරු (4) වලීවරු

37 ෂව්වාල් මාසයේ පළමු හඳ දුටු විට සව්මය ඉටු කිරීම,

(1) හරාම් (2) ෆර්ල් (3) සුන්නත් (4) මක්රූහ්

38 නබි (සල්) තුමා විසින් රුකානා නම් ශූරයා පරාජයට පත් කළ ක්‍රීඩාව,

(1) අශ්වාරෝහනය (2) මල්ලවපොර (3) පිහිනීම (4) ඊවිදීම

39 අල්කුර්ආනයට අර්ථ විවරණ ලියන්නේ,

(1) මුහද්දිස්වරු (2) මුජ්තහීද්වරු

(3) මුෆස්සිර්වරු (4) මුර්තද්වරු

40 තෞර් නම් ස්ථානය සම්බන්ධ වන්නේ,

(1) මිහ්රාජ් (2) නුබුව්වත්

(3) හුදෙබියා (4) හිජ්රත්

(ල. 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. තෝරාගත් තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01 (1) ෆික්හුල උස්රා යනු කුමක්ද ?

(2) කියාස්හි රුකුන් නම් කරන්න.

(3) කාන්තාවන්ට හලාල් වුත් පිරිමින්ට හරාම් වුත් ඇඳුම් සහ ආභරණ කවරේද ?

(4) ඉජ්මාහි දෙවර්ගය සඳහන් කරන්න.

(5) හජ් හා උම්රා අතර ප්‍රධාන වෙනස කුමක්ද ?

(6) අහ්සාබ් යුද්ධයේදී අගල් කැපීමට යෝජනා කළ සහාබිවරයා කවුරුන්ද ?

(7) අයිෂා (රලි) තුමියට හිමි ගෞරව නාමයන් කවරේද ?

(8) ඉමාම් අබු හනීෆා රචිත ෆික්හ් ග්‍රන්ථය කුමක්ද ?

(9) වන්දිය හඳුන්වන අරාබි පදය කුමක්ද ?

(10) මහර් යනු කුමක් ද? (2 x 10 = 20)

02 (1) ඉජ්තිහාද් හි යෙදුනු සහාබාවරු 04 දෙනෙක් නම් කරන්න (ල. 02)

(2) මරණින් මතුවද ආනිසංස ගෙන දෙන කරුණු 03 ක් ලියන්න (ල. 03)

(3) දෛනික ක්‍රියාකාරකම් ඉබාදත් වීමට අවශ්‍ය කොන්දේසි සඳහන් කරන්න. (ල. 05)

03 (1) සන්නිවේදන මාධ්‍යයක තිබිය යුතු ලක්ෂණ 04 ක් සඳහන් කරන්න. (ල. 02)

(2) හදීස් නබවි හි කොටස් හඳුන්වන්න. (ල. 03)

(3) වසීයියත් සඳහා වූ කොන්දේසි ලියා දක්වන්න. (ල. 05)

04 (1) උමර් (රලි) තුමා සිදුකළ පොදු සුබසාධක සේවා 04 ක් ලියන්න. (ල. 02)

(2) උමෙයියා පාලනය පිරිහීමට හේතු 03 ක් ලියන්න. (ල. 03)

(3) අබ්බාසියා පාලකයන් පස්දෙනෙකු නම් කරන්න. (ල. 05)

05 (1) බූදලය බෙදා දීමට පෙර කළ යුතුකම් 04 ක් සඳහන් කරන්න. (ල. 02)

(2) ශ්‍රී ලංකාවට අරාබි ජාතිකයන් පැමිණීමට හේතු වූ කරුණු 03 ක් ලියන්න. (ල. 03)

(3) ජරාඉමුල් හුදුද් ගණයට අයත් අපරාධ 05 ක් අදාල අඬුවම සමඟ ලියා දක්වන්න. (ල. 05)

06 (1) කෙටි සටහන් ලියා දක්වන්න.

(1) හව්ෆ් (2) තව්බා (3) තවක්කුල් (4) රිලා (2½ x 4 = 10)

07 (1) ඉමාම් ෂාෆීර් (රහ්) තුමා රචිත ග්‍රන්ථ 04 ක් නම් කරන්න. (ල. 02)

(2) අරෆා දේශනයේ ඇතුළත් සාරාංශගත කරුණු 03 ක් ලියන්න. (ල. 03)

(3) මානසික සුවය පතා ඉස්ලාම් ඉදිරිපත් කරන අධ්‍යාත්මික ක්‍රියාකාරකම් 05 ක් සඳහන් කරන්න. (ල. 05)

The National e-Learning Portal for the General Education